# තථාගත වීමංසනය අනාවරණය කෙරෙන විමංසක සූත්‍රය

*- දුනුකේඋල්ලේ සාරානන්ද හිමි -*

**වීමංසක සූත්‍ර සාරාංශය :-**

තථාගතයන් වහන්සේ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි භික්ෂූන් වහන්සේ අමතා මෙවන් කරුණක් පිළිබඳ කරුණු ගෙනහැර දක්වා වදාළසේක. කෙසේද යත්, මහණෙනි, අනුන්ගේ සිත් පිළිබඳ නොදන්නා වූ නමුත් විමර්ශනයේ යෙදෙන්නා වූ පුහුදුන් භික්ෂුව විසින් තථාගතයන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ වනවා ද? නොවනවා ද? යන්න විමසා බැලිය යුතු ය, යනුයි.

ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට පවත්නාහ. භාග්‍යවතුන් වහන්සේ වෙතින් පහලවන්නාහ. එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. එමනිසා මෙම කරුණු භාග්‍යවතුන් වහන්සේගෙන් ම අසා දැනගත යුතු වන්නාහ. ඒ අනුව සම්බුද්ධත්වය පරීක්ෂා කරන්නෙකු විසින් සලකා බැලිය යුතු කරුණු කිහිපයක් මෙහි සඳහන් වේ. ඒවා මෙසේ සාරාංශ කොට දැක්විය හැකිය.[1]

---

1 මජ්ඣිම නිකාය, දෙවන කාණ්ඩය, ඒ.ජී. ද සොයිසා, සිංහල පරිවර්තනය, ධර්මසමය යන්ත්‍රාලය, කොළඹ, 243 පිටුව, 1962.

- බුදුරජාණන් වහන්සේගේ වචනය හා ක්‍රියාවන් කෙලෙසුන්ගෙන් කිලිටි වී ඇද්දැයි සොයා බැලිය යුතුයි.
- එම ක්‍රියාවන් කලින් කලට කිලිටිව පවතිනවා ද? නැතහොත් පිරිසිදුව පවතිනවාදැයි සොයා බැලිය යුතුයි.
- පිරිසිදු වචන හා ක්‍රියාවන් බුදුරජාණන් වහන්සේ වෙත තිබෙනවා ද නැද්දැ යි විමසා බැලිය යුතුයි.
- දිගු කලක සිටම බුදුරජාණන් වහන්සේගේ වචන සහ ක්‍රියා ජීවිකාව පිරිසිදු ද කියා පරීක්ෂා කර බැලිය යුතුයි.
- යසස, කීර්ති, ප්‍රශංසා, පිරිවර සම්පත් ආදිය ලැබීම හේතුවෙන් බුදුරාජණන් වහන්සේට මානාදිය ඇද්දැයි සොයා බැලිය යුතුයි.
- බුදුරාජණන් වහන්සේ සරාගී බවින් මිදි විරාගී බවට පත්ව කාම සේවනය නොකර සිටින්නේ භය නිසාදැයි පරීක්ෂා කර බැලිය යුතුය.[2]

ඉහත කරුණු විචාර බුද්ධියෙන් යුතුව පරීක්ෂා කර බලා ස්වතන්ත්‍රව, ස්වාධීනව, ස්වෛරීව, තමතමා විසින් ම තීරණයකට බැස ගත යුතුය. ඒවා පිළිබඳ සොයා බලන්නෙකුට බුදුරජාණන් වහන්සේගේ පාරිශුද්ධත්වය මැනවින් අවබෝධ කරගත් නමුත් ඒ සම්බන්ධයෙන් බුදුරාජණන් වහන්සේගෙන් ද අසා දැනගන්නට අවශ්‍ය බව මෙම සූත්‍රයෙන් ගෙනහැර දක්වනු ලැබේ. [3]

**හැඳින්වීම :-**

භාරතීය ආගමික හා සාමාජීය පසුබිම තුළ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ නිරන්තරයෙන් සාකච්ඡාවට ලක්විය. මෙම තත්ත්වය වෛදික සමාජ පසුබිමේ පටන් බුද්ධකාලීන භාරතීය සමාජ පසුබිම දක්වා නිරන්තරයෙන් සංවාදයට, විවාදයට පමණක් නොව උනුත් අතර

---

[2] ශ්‍රී කල්‍යාණි දුරුතු ධර්ම දේශනා, සංස්. මොරවක ධම්මානන්ද ස්ථවිර, ශ්‍රී කල්‍යාණි රජමහාවිහාරය, 308 පිටුව, 2007.

[3] මජ්ඣිම නිකාය, දෙවන කාණ්ඩය, ඒ.ජී. ද සොයිසා, සිංහල පරිවර්තනය, ධර්මසමය යන්ත්‍රාලය, කොළඹ, 248 පිටුව, 1962.



විවේචනයට ද ලක් වූ අයුරක් වෛදික සාහිත්‍යය මෙන්ම බෞද්ධ සූත්‍ර සාහිත්‍යය ද අධ්‍යයනය කිරීමේ දී අනාවරණය කරගැනීමට පුළුවන.

උක්ත ආගමික මතවාද අතර සංවාදයට භාජනය වූ තවත් ප්‍රධාන මාතෘකාවන් ලෙස "සිතීමේ හා විමසීමේ නිදහස" යන මාතෘකාව ගෙනහැර දැක්වීමට පුළුවන. බ්‍රාහ්මණ සාහිත්‍ය තුළ පැවති උග්‍ර ප්‍රතිපත්ති ඔස්සේ මිනිස් සමාජයේ සිතීමේ හා විමසීමේ නිදහසට පවරා තිබූ බාධක අනාවරණය කර ගැනීමට පුළුවන. එවන් පසුබිමක් තුළ බුදුසමය මිනිසාගේ සිතීමේ හා විමසීමේ නිදහසට විවෘත පරිසරයක් නිර්මාණය කරන ලද ආකාරය මැනවින් විශද කරන අතර, එම තත්ත්වය ත්‍රිපිටක සාහිත්‍යය පුරා පවත්නා විවිධ සූත්‍ර අධ්‍යයනය කිරීමේ දී අනාවරණය කරගැනීමට අවකාශය ද උදා වේ. කෙසේ වුව ද ප්‍රාග් බෞද්ධ භාරතීය සමාජයේ මානවහිතවාදී චින්තකයෝ ප්‍රධාන වශයෙන් කොටස් තුනකට වර්ගකොට දැක්වීමට පුළුවන. එනම්,

01. සාම්ප්‍රදායික චින්තකයෝ
02. බුද්ධිවාදී චින්තකයෝ
03. අනුභූතිවාදී චින්තකයෝ [4]

වශයෙනි.

## 01. සාම්ප්‍රදායික චින්තකයෝ :-

මොවුන් පාරම්පරික අදහස් වැදගත් ලෙස පිළිගත්තහ. මොවුන්ගේ අදහස් වූයේ ප්‍රධාන වශයෙන් මිනිසා ලෝකය පිළිබඳ ඥානය ඇති කරගන්නේ සාම්ප්‍රදායික මත අනුවම ය. සම්ප්‍රදායවාදීහු වේද යුගයේ සිට ආරණ්‍යක යුගය දක්වා පැවති කාලසමයට අයත් වෙති. මොවුන් ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට බෙදේ. එනම්

---

[4] ආදි බෞද්ධ චින්තනය අදහස් කිහිපයක්, චන්ද්‍රිම විජය බණ්ඩාර, එච්.එම්. මොරටුවගම, එස් ගොඩගේ සහ සහෝදරයෝ, 3 පිටුව, 1995.

ශ්‍රැතියවාදීහු, ස්මෘතිවාදීහු, පෞර්ෂයවාදීහු, අපෞර්ෂයවාදීහු, වෛදික, අවෛදිකවාදීහු වශයෙනි.

**02. බුද්ධිවාදී චින්තකයෝ :-**

මිනිස් බුද්ධිය මෙහෙයවා ලෝකය හා මිනිසා පිළිබඳ යථාර්ථය දත හැකියි. මෙම චින්තකයෝ ප්‍රකාශ කළහ. මොවුහු මිනිසා හා ලෝකය දෙස බලා අධිභෞතිකවාදී මතවල එල්බ ගත්තහ. ඒ සඳහා තර්කය අවියක් කොට ගත්තහ. මෙම චින්තකයන් ආරණ්‍යක යුගයේ සිට උපනිෂද් යුගය දක්වා වාසය කරන්නට විය.

**03. අනුභූතිවාදී චින්තකයෝ :-**

මිනිසා හා ලෝකය පිළිබඳ දැනුම ලබාගත යුත්තේ මිනිස් අනුභූති මගින් යයි ප්‍රකාශ කළෝ අනුභූතිවාදීහු ය. ඉන්ද්‍රියබද්ධ මනසින් පමණක් ඥානය ලබාගත හැකිය යනු මොවුන්ගේ මතය විය. තර්කය අනුව අනුමාන කරන අය මේ සංඛ්‍යාවට ඇතුළත් වෙති. පශ්චාත් කාලීන උපනිෂද් චින්තකයෝ මෙයට ඇතුළත් වේ.[5]

සමස්තයක් ලෙස සලකා බලන කල්හි බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් කාලසමයන්හි ඒ ආකාරයෙන් ම ශ්‍රැතිය පිළිගන්නා ලද බවක් දක්නට නොලැබේ. සම්බාධ සහිත චින්තනයන්ට ප්‍රතිපක්ෂව විමංසනාත්මක ගුරුකුලයන් වැඩි වශයෙන් බිහිවන්නට විය. ඒ අනුව ස්වකීය අනුගාමික ශාස්තෘවරයාණන් පිළිබඳව පවත්නා ලද ගතානුගතික චින්තනය වෙනස් වෙමින් විමර්ශනාත්මකව විමසා බැලීමට උත්සුක වූ අයුරු කරුණු අධ්‍යයනය කිරීමේදී තහවුරු කරගත හැකිය. මේ අනුව භක්තිවාදය ප්‍රතික්ෂේප වී බුද්ධිවාදයට මුඛ්‍යස්ථානයක් හිමිවන්නට විය.

---

5 - එම - ,3 - 4 පිටු.



**අසහාය දේවවාදී සංකල්පය හා මානුෂවාදී සංකල්පය :**

නිර්මාණවාදී ආගමික සංකල්ප රැගත් හින්දු, ඉස්ලාම් හා කිතුනු ආගමික සම්ප්‍රදායන් තුළ ස්වකීය ශාස්තෘවරයාණන් වහන්සේ අසහාය දෙවියෙකු ලෙස හඳුන්වා දෙන ලදී. එනමුදු බුදු දහම ලොවට හඳුන්වා දෙන තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ පිළිබඳ කරුණු අනාවරණය වන්නේ සුවිශේෂී මනුෂ්‍යයෙකු වශයෙන් උන්වහන්සේ ලෝකය පිළිබඳ යථාර්ථය ඇත්ත ඇතිසැටියෙන් අවබෝධකරගත් මෙලොවෙහි උත්තරීතම මිනිස් සත්වයා වශයෙනි.

වෛදික ආගමෙහි මූලාරම්භය ද මෙකී දේවවාදය යි. දේවත්වය පිළිබඳ මෙකී නොදියුණු හැඟීම් ආගමික වශයෙන් ද බලපවත්වන්නට විය. එනම් පරලොව පිළිබඳ බියජනක හැඟීම් ආගමික වශයෙන් ද බලපවත්වන්ට විය. එනම් පරලොව පිළිබඳ බියජනක හැඟීම් ඇතිවෙන්නට වීමෙන් එයින් ගැලවීමට ද දෙවියන්ගේ ම පිහිට පතන්නට වූහ. ආගම් නොදියුණු මොළයෙන් ඇතිවූවෙකැයි වර්තමාන දාර්ශනිකයන් කියන්නේ එහෙයිනි. ආගම් වූ කලී මිථ්‍යා විශ්වාසවලින් මෙන්ම අහේතුක ශක්තියෙන් පිරී පවතින්නෙකි. එහෙත් දර්ශනය යථාර්ථය උගන්වන සහේතුක මානුෂික බුද්ධියට ගොදුරුවන විධිමත් ඉගැන්වීම් ක්‍රමය කි.[6]

බහුදේවවාදී කාලසමය තුළ විකසිත වූ ප්‍රධාන දේව සංකල්පය වූයේ "ඉන්ද්‍ර" ය. ඔහු වර්ෂාවේ අධිපති දෙවියා ය. මෙයට අමතරව "වරුණ", "අග්නි" ආදී දෙවිවරු ද විය. මොවුන් අරමුණු කොටගෙන යාගහෝම පැවැත්වීම දක්නට ලැබේ. උපනිෂද් කාලසමය පමණ වන විට බහුදේවවාදය ගිලිහී ගොස් ඒකදේවවාදයට සම්ප්‍රාප්ත වන අතර, එහිදී "බ්‍රහ්මන්" අසහාය දෙවියන් බවට පත්වේ. මේ සඳහා ස්ත්‍රී පුරුෂ

---

6 සංස්කෘත සාහිත්‍ය, ජී.එස්.බී. සේනානායක, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 19 පිටුව, ද්වතීය සංස්කරණය, 1960.

භේදයක් දක්නට නොලැබෙන අතර එහි දක්නට ලැබෙන්නේ අසහාය නිර්මාණවාදී දේව සිද්ධාන්තයක් පමණි. එහි නව සංවර්ධනය ලෙස "බ්‍රහ්මන්", "විෂ්ණු" හා "ශිව" යැයි ත්‍රිමූර්ති සංකල්පයක් ගොඩනැගෙන අතර එහි ප්‍රධානියා "බ්‍රහ්මන්" හෙවත් "මහාබ්‍රහ්මන්" ය. ඔහු සර්වඥ්‍රෝභද්‍ර, සර්වව්‍යාපී යන ගුණාංගයන්ගෙන් සමන්විත වේ. "ලක්ෂ්මී", "රාධා", "රුක්මණී", "දුර්ගා", "කාලි", "සරස්වතී" ආදී දෙවිවරු ද හින්දු ආගමික සංස්කෘතිය තුළ පූජ්‍යත්වයට ලක් වේ.

මෙයට අමතරව "ශිව" දෙවියන් ඇසුරින් සිදුකරන "ශිවලිඞග' පූජාවට ද හින්දු සමය තුළ ප්‍රමුඛත්වයක් හිමි වේ. මෙය හුදු කාමෝත්සවයක් හෝ කෲර පූජා විධියක් නොවේ. මෙය ශිව ආගමේ ප්‍රධාන ආගමික සිතුම් පැතුම් චිත්තවේගමය වනවාට වඩා විද්‍යාත්මක වූ ද දාර්ශනික වූ ද ඒවා වේ. උත්පාදනය කරන්නා වූ විශ්වව්‍යාප්ත බලවේගය පිළිබඳව විනීත ආගමික හැඟීම් ලිංග වන්දනාවේ නිරූපණය වේ.[7]

කිතුනු සමය තුළ අසහාය දෙවියන්ගේ සහව්‍යතාවයට ගමන් කිරීම ගෙනහැර දක්වනු ලැබේ. එම තත්ත්වය ශුද්ධාත්මයාණන් වශයෙන් ගෙනහැර දක්වනු ලැබේ. ශාඛා භේදයක් නැතිව සෑම ක්‍රිස්තු භක්තිකයෙකු විසින් ම අවිවාදයෙන් පිළිගනු ලබන ධර්මතා අතින් පළමු වැන්න ඒක පරමෝත්තම දෙවිකෙනෙකු පිළිබඳ විශ්වාසය යි. එය ක්‍රිස්තියානියේ ප්‍රධානතම ධර්මතාව සේ ද සැලකිය හැක්කකි.

ක්‍රිස්තියානි චින්තනයට එය කෙතරම් වැදගත් වේ ද කිවහොත් ක්‍රිස්තියානි ජීවන ක්‍රමය ඒකදේව විශ්වාසීය ජීවිත ක්‍රමයක් සේ වුව ද දැක්විය හැකි තරම් ය. ක්‍රිස්තියානිය ආරම්භ වීමට බොහෝ පෙර සිටම යුදෙව්වෝ තම ආගමේ පදනම සේ සැලකූහ. යුදෙව්වන්ගෙන් ලැබුණ

7 ආගමික දර්ශනය හා සදාචාරය, එම්.ඒ. මනුරත්න, මනුලා මුද්‍රණාලය, 93 පිටුව, 1995.



ආගමක් වන නිසාම ක්‍රිස්තියානි ඒකදේව විශ්වාසය යුදෙව් චින්තනය මුල් කරගෙන ම තේරුම් ගත යුත්තකි. බයිබලය අනුව සලකා බලන කල්හි ඒකදේව විශ්වාසය තුළින් මිනිසාගේ යහපතට ඉවහල් වන කරුණු දෙකක් ගෙනහැර දැක්වූහ.

01. මිනිසාගේ විමුක්ති දායකයාණන් සේත්.[8]

02. විනිශ්චයකාරයාණන් සේත්.[9]

එක විට ම විමුක්ති දායකයාණන් ද, විනිශ්චයකරුවාණන් ද වන දෙවියන් වහන්සේ යුදෙව් චින්තනය අනුව මිනිසාට කථාකරන්නේ ද වේ. මිනිසාට සිය ජීවිතයේ අවශ්‍යතාවල දී උදව් උපකාර කිරීම සඳහාත් යුක්ති ගරුකත්වයට මිනිසා නැඹුරු කිරීම සඳහාත් දෙවියෝ මිනිසාට කථා කරන්නේ ය.

ඉස්ලාම් ආගම මොලොවට හඳුන්වා දුන් නිර්මාතෘවරයා "මුහම්මද්" තුමා හෙවත් නබිතුමා ය. ඔහු උපන්නේ ක්‍රි.ව. 570 දී ය. ඉස්ලාම් හෙවත් ඉස්ලාම් බැතිමත්තු නබිතුමා යනුවෙන් බහුලව භාවිතා කෙරෙන අතර "නබි" යන වචනයේ අර්ථය වන්නේ "දෙවියන්ගේ පණිවුඩකරුවා" හෙවත් "දිවැසිවරයා" යන්න යි. මෙතුමා අරාබි ජාතිකයෙක් විය. බටහිර අරාබියාවේ පිහිටි "මක්කම" හෙවත් "මැකාව" මොහුගේ ජන්ම භූමිය යි. මෙම නගරය සුප්‍රසිද්ධ වෙළඳ මධ්‍යස්ථානයක්

8 "අයකැමියෙකු වූ මතෙව් තමා සන්තක සියල්ල අතහැර යේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු විය. ශතවර්ෂ ගණනාවකට පෙර දෙවියන් වහන්සේ තම දිවැසුරුවන් ලවා පොරොන්දු ප්‍රකාර ලෝකයේ විමුක්ති දායකයාණන් යේසුස් වහන්සේ බව මතෙව් ඔප්පු කරයි" ජීවමාන බයිබලය, නව ගිවිසුම, තිසර මුද්‍රණ, දෙහිවල, 1980, 01 පිටුව (මින් ඉදිරියට නව ගිවිසුම භාවිතා කරන බව සැලකිය යුතුයි)

9 "යේසුස් වහන්සේගේ ජීවිතයේ අවසාන මොහොත පැමිණි කළ උන්වහන්සේ සතුරන්ට ප්‍රේම කරමින් කුරුසිය මත මහත් දුක් වේදනාවන් විඳිමින් ලෝ වාසීන්ගේ පව් අහෝසි කිරීමට දිවූ පිදූ අයුරු ද ඉන් අනතුරුව ............

- එම -

වූ අතර සිරියාවේ සිට යේමනය, ඉන්දියාව වැනි රටවලට යන එන ඔටු තවලම් නතර කරන ලද්දේ මොහු විසිනි.[10] කෙසේ වුව ද ඉස්ලාම් දහම තුළ ප්‍රධාන ශාස්තෘවරයාණන් වහන්සේ අසහාය දෙවියෙකු වශයෙන් විස්තර කෙරෙන අතර, එම අසහය නිර්මාතෘ දේව සංකල්පය විවේචනයකින් තොරව පිළිගත යුතු බව ද දන්වා සිටින අතර එය දෙවියන් වහන්සේ වෙනුවෙන් සිදු කරන අසහය ගෞරවයක් ලෙස ද සලකනු ලැබේ. ඒ අනුව උක්ත අදහස පහත අයුරින් ගෙනහැර දක්වයි.

*"අල්ලා හැර අන් දෙවි කෙනෙක් නැත.*
*මහමුත් උන්වහන්සේගේ පණිවුඩකරුය."*[11]

දේවවාදී ආගමික අදහස්වලින් තොරව වූ බෞද්ධ චින්තනය තුළ විග්‍රහයට ලක්වනුයේ මානුෂවාදී ශාස්තෘවරයෙකු පිළිබඳවය. මෙම අධ්‍යයනය වීමංසක සූත්‍රයට අටුවාවක් වනු නොවනු මානය. ලෝකයෙහි එතෙක් කිසිදු ශාස්තෘවරයෙකු විසින් සොයාගෙන නොතිබූ නවලෝකෝත්තර සද්ධර්මය සොයා දැනගෙන සම්‍යග් සම්බෝධියට පත් වූ තථාගතයන් වහන්සේට සසර දුකින් මිදීම හේතුවෙන් නිරාමිස ප්‍රීති වේගයක් පහළ විය. ඒ ප්‍රීතිය උන්වහන්සේ ප්‍රකට කළේ උදාන ගාථාවක් ප්‍රකාශ කිරීමෙනි. සම්මාසම්බුදු රාජණන් වහන්සේගේ ඒ ප්‍රථම උදානය සුවිශේෂී ශාස්තෘවරයාණන් වහන්සේගේ අපූර්වත්වය මනාව විෂද කරනු ලැබේ.

*"අනේකජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං*
*ගහකාරකං ගවේසන්තො - දුක්ඛාජාති පුනප්පුනං*
*ගහකාරක දිට්ඨෝසි - පුන ගෙහං න කාහසි*
*සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසංකිතං*
*විසංකාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගාත"*[12]

---

10 ඉස්ලාම් ධර්මය හා සමාජ ක්‍රමය, වී.ජී. නන්දන පෙරේරා, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 06 පිටුව, 2004.

11 සිංහල විශ්වකෝෂය, සිව්වැනි කාණ්ඩය, (ඉඳු - ඌරා:), සංස්කෘතික දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය, 303 පිටුව, 1970.

12 සමන්තකූටවණ්ණනා,



"සසරෙහි නැවත නැවත ඉපදීම දුකකි. එබැවින් (ආත්ම භවය නැමති) ගෙය සාදන (තෘෂ්ණාව නැමති) වඩුවා සොයන්නා වූ මම නොයක් ජාතීන් හි සසර ඇවිද්දෙමි, එම්බා (තෘෂ්ණාව නැමති) වඩුවා මවිසින් නුඹ දන්නා ලද්දෙහි ය. නැවත ඔබ මට (පඤ්චස්කන්ධය නැමති) ගෙය නොසාදන්නෙහි ය. තාගේ සියලු (කෙලෙස් නැමති) පරාල මවිසින් බිඳ දමන ලදී. (අවිද්‍යාව නැමති) කැණිමඩල විනාශ කරන ලදී. දැන් මාගේ සිත අරමුණු කිරීම වශයෙන් නිවනනට පැමිණියේ ය. තෘෂ්ණාක්ෂය වූ අරහත් ඵලයට පැමිණියෙමි."

උක්ත උදානය දෙස අවධානය යොමු කරන කල්හි මනුෂ්‍යයෙකු වශයෙන් මෙලොව ජනිත වී ලෝකයෙහි පවත්වන්නා වූ ස්වභාවයන්ට මුහුණ දී එහි යථාර්ථය අවබෝධ කොට ගෙන සුවිශේෂී තත්ත්වයකට පත් වූ අයුරු මැනවින් ගෙනහැර දක්වනු ලැබේ. මෙහිදී අසහාය දෙවියෙකු යන මිථ්‍යා විශ්වාසය ප්‍රතික්ෂේප කොට උත්තරීතර මනුෂ්‍යයෙකු ලෙස කරුණු ගෙනහැර දක්වනු ලැබේ.

ශාස්තෘවරයාණන් වහන්සේ පිළිබඳ මනුෂ්‍යවාදී චින්තනය පිළිබඳ කරුණු සලකා බැලීමේ දී කදිම නිදසුනක් අනාවරණය වනුයේ බුදුරජාණන් වහන්සේ සහ ද්‍රෝණ නම් බමුණා අතර සිදුවන සංවාදයෙනි. මෙහිදී උක්කට්ඨා හා සේතව්‍යා නගර අතර පා ගමනින් වඩින බුදුරජාණන් වහන්සේගේ පා සටහන දකින ද්‍රෝණ බ්‍රාහ්මණයා විශ්වාස කරනුයේ මනුෂ්‍යයෙකුගේ පා සටහන් නොව දෙවියෙකුගේ පා සටහන් ලෙස ය. ද්‍රෝණ බ්‍රාහ්මණයා අසන පහත පැනයන්ගෙන් මෙම තත්ත්වය මැවින් අනාවරණය වේ.

ද්‍රෝණ බමුණා - ඔබ දෙවියෙක්ද?
බුදුහු - බමුණ මම දෙවියෙක් නොවෙමි.
ද්‍රෝණ බමුණා - ඔබ ගාන්ධර්වයෙක් ද?
බුදුහු - බමුණ මම ගාන්ධර්වයෙක් ද නොවෙමි.

2 MAY 2012

ද්‍රෝණ බමුණා - ඔබ යක්‍ෂයෙක් ද?

බුදුහු - බමුණ මම යක්‍ෂයෙක් ද නොවෙමි.

ද්‍රෝණ බමුණා - මම ඔබෙන් දෙවියෙක් දැයි ඇසූ විට මම දෙවියෙක් නොවෙමි කියයි. ඔබ ගාන්ධර්වයෙක් ද? යක්‍ෂයෙක් ද? මනුෂ්‍යයෙක් දැයි ඇසූ විට මම ගාන්ධර්වයෙක්, මනුෂ්‍යයෙක්, යක්‍ෂයෙක් හෝ නොවෙමියි කියයි. එසේ නම් ඔබ කවරෙක් ද?

බුදුහු - මා දෙවියෙක් නම් දෙවියෙකු තුළ පවත්නා කාමාදී ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම කාමාදී ආශ්‍රවයන් සහමුලින්ම ප්‍රහීණ කළෙමි. මුලිනුපුටා දමමි. ඒ නිසා මම දෙවියෙක් නොවෙමි. බ්‍රාහ්මණය මම ගාන්ධර්වයෙක් නම් ගාන්ධාර්වයෙක් තුළ පවත්නා කාමාදී ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම කාමාදී ආශ්‍රවයන් ප්‍රහීණ කළෙමි. ඒ නිසා මම ගාන්ධර්වයෙක් නොවෙමි. බ්‍රාහ්මණය මා යක්‍ෂයෙක් නම් යක්‍ෂයෙක් තුළ පවත්නා කාමාදී ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම ඒ සියල්ල ප්‍රහීණ කළෙමි. එනිසා මම යක්‍ෂයෙක් නොවෙමි. බ්‍රාහ්මණය මා සාමාන්‍ය මනුෂ්‍යයෙක් නම් සියලු මිනිසුන් තුළ පවත්නා කාමාදී ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම ඒ සියල්ල ප්‍රහීණ කළෙමි. ඒ නිසා මම අනෙක් මිනිසුන් වැනි මිනිසෙක් ද? නොවෙමි. බ්‍රාහ්මණය උපුලක් හෝ පියුමක් හෝ හෙළ පියුමක් හෝ දියෙහි ඉපිද දියෙහි වැඩී දියෙන් ඉස්මතු වී දියෙහි නොගැටී තිබෙනවා වාගේ මමත් ලෝකයෙහි මිනිසුන් අතර ඉපිද, ලෝකයෙහි මිනිසුන් අතර වැඩී, ලෝකයාගෙන්, මිනිසුන්ගෙන්, ඉස්මතුවී, ලෝකයා සමග නොගැටී, නොබැඳී සිටිමි. ඒ නිසා බමුණ මම මිනිස් දූර්වලකම් නැති කළ උත්තරීතර මනුෂ්‍යයෙක්මී. මා හැඳින්විය යුතු හොඳම නම "බුද්ධ" යනුයි." බුද්ධෝති මං බ්‍රාහ්මණ ධාරෙහි"[13] උක්ත අදහස ම පහත සඳහන් ගාථා පාඨයෙන් ද අනාවරණය වේ.

[13] අඞ්ගුත්තර නිකාය, චතුක්ත නිපාතය, දෝණලෝක සුතත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005



*"යථා සඞ්කාරධානස්මිං*
*උජ්ඣිතස්මිං මහාපථෙ*
*පදුමං තත්ථ ජායෙථ*
*සුචිගන්ධං මනෝරමං"* [14]

එනම් "යම්සේ කුණු දමන ස්ථානයක බීජයකට අවශ්‍ය පස හා ජලය මනාව තිබේ නම් එයින් හට ගන්නා පැලෑටිය අන්තයේ දී සුවඳවත් වූ ලෝකයාගේ සිත් ගන්නා සුළු වූ සුන්දර මලක් විකසිත කෙරුවේ සමාජයට මනා ආදර්ශයක් ජනිත කරවමිනි". මේ අනුව මිනිස් සමාජයෙන් ජනිත වූ තථාගතයන් වහන්සේ ද ඒ හා සමානය.

උක්ත සංවාදය දෙස අවධානය යොමු කොට විමසීමේ දී තහවුරු වනුයේ ශාස්තෘවරයාණන් වහන්සේ අසහාය දෙවියෙකු, බ්‍රහ්මයෙකු නොවන අතර උත්තරීතරත්‍වයට ප්‍රාප්ත වූ සුවිශේෂී මනුෂ්‍යයකු ම වන බවයි. උක්ත කාරණය තවදුරටත් තහවුරු වනුයේ පහත සංසිද්ධිය තුළිනි. මහලු පියෙකු තම මරණ මඤ්චකය වටා රැස්ව සිටින දූදරුවන් අමතා කියන අන්තිම වචනයේ විලාසය මෙහි දක්නට ඇත. බුදුන් වහන්සේ මිනිසෙකු වශයෙන් මිනිසුන් සමග කතා කරන අයුරු මෙහි හොඳින් දිස්වේ.

"ආනන්දය මම දැන් ජරාවට, වැඩිවයසට, මහළු බවට, වයස්ගත බවට, පත්වීමි. මගේ වයස අසූවකි. දිරු රියක් රෝද බැඳීම් ආදි ප්‍රතිසංස්කරණයෙන් අල්ලා සිටිනවා සේ මාගේ කය ද අර්හත් බලවේගයෙන් බඳනා ලදුව අල්ලා සිටී." [15]

[14] ධම්මපදය, පුෂ්ප වග්ගය, 16 ගාථාව, ලෙවන්ගම සරණංකර සංස්. 1983.

[15] දීඝනිකාය, ද්විතීය භාගය, මහාපරිනිබ්බාන සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005.

උක්ත සාධක මඟින් තහවුරු කරනුයේ බුදුසමයේ ප්‍රධාන නිර්මාතෘවරයාණන් වහන්සේ වන තථාගතයන් වහන්සේ අසහාය දෙවියෙකු නොවන බවත්, උන්වහන්සේ උත්තරීතරර මනුෂ්‍යයෙකු වන බවත් ය.

**වීමංසක සූත්‍රයෙහි අන්තර්ගත තථාගත පරීක්‍ෂාව :**

මජ්ඣිම නිකායේ වීමංසක සූත්‍රයෙහි අන්තර්ගත කරුණු අධ්‍යයනය කිරීමේදී එහි මූලික පරමාර්ථය වන්නේ, සෑම අයෙකු විසින් ම තම ශාස්තෘවරයාණන් වහන්සේ පිළිබඳ නිරන්තරයෙන් අධ්‍යයනය කිරීම සුදුසු බව ය. එමෙන්ම ඒ සෑම අවස්ථාවකම ශාස්තෘවරයාණන් වහන්සේ විචාරපූර්වක වීමංසනයට ලක් කිරීමේ නිදහස ද ශ්‍රාවකයන්ට ලබාදීමත් යන හේතු යුක්තීන් පදනම් කොටගෙන උක්ත සූත්‍රය සුවිශේෂී ස්ථානයක් හිමි කරගනී. මෙම තත්ත්වය මානව සංහතියේ ස්වාධීන චින්තනයට ලබාදෙන ලද කදිම නිදසුනකි.

වීමංසක යන්නෙහි අර්ථය පිළිබඳ කරුණු අධ්‍යනය කිරීමේ දී ත්‍රිපිටක සාහිත්‍ය තුළ මෙලෙස විග්‍රහකොට ගෙනහැර දක්වනු ලැබේ.

*"නත්ථි සමණස්ස උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සන විසෙසො තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභානං ......"*[16]

උක්ත පාඨය දෙස අවධානය යොමු කිරීමේ දී තහවුරු වනුයේ "වීමංසා" ශබ්දය ප්‍රඥාව, ධර්ම චින්තනය, මෙනෙහි කිරීම, අත්හදා බැලීම යනාදී අර්ථවල යෙදී ඇත. මෙම අදහස පහත සඳහන් අටුවා විස්තරයෙන් ද අනාවරණය වේ.

[16] මජ්ඣිම නිකාය 1, මහාසීහනාද සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005.



*"මුනි සස්සතදිට්ඨි නිස්සිතාති ඤත්වා උච්ඡේද දිට්ඨි නිස්සිතාති ඤත්වා සස්සතුච්ඡේද නිස්සිතාති ඤත්වා තුලයිත්වා, තීරයිත්වා, විභාවයිත්වා, විභූතං කත්වා සො වීමංසති, පණ්ඩිතො පඤ්ඤා වා, බුද්ධිමා, විභාවී මෙධාවීති"*[17]

මේ අනුව බුදුසමයේ සිතීමේ හා විමසීමේ නිදහසට කෙතරම් ඉඩ ප්‍රස්ථාවක් ලබා දී තිබේ ද යන්න උක්ත ප්‍රකාශනය තුළින් මැනවින් විශද වේ. අන්දානුකරණය ප්‍රතික්ෂේප කොට ස්වයං විචාරපූර්වක චින්තාවකට ඉඩ ප්‍රස්ථාව ලබාදෙන අන්දම එක් පසෙකින් තහවුරු වේ. මෙම තත්ත්වය වීමංසක සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ වුව ද වීමංසනයට ලක් කිරීමට ලබා දී තිබෙන නිදහස තුළින් තවදුරටත් තහවුරු වේ. මෙම තත්ත්වය ලෝක ආගම් අතර සුවිශේෂී අවස්ථාවක් ලෙස ද ගෙනහැර දැක්විය හැකිය.

වීමංසක යන පදයේ අර්ථය නම් කිම? "වීමංසතීති විමංසකෝ" විමර්ශනය නැතහොත් පරීක්‍ෂා කෙරෙනුයි වීමංසක නම් වේ. එනම් විමර්ශනය, පරීක්‍ෂණය, ගවේෂණය, නිරීක්ෂණය කරන්නා වීමංසක නමින් හැඳින්වේ යනුයි.[18] වීමංසනය පිළිබඳ කරුණු දක්වන පපංඤ්චසූදනී අටුවාව මෙලෙස විග්‍රහකොට දක්වයි.

*"තත්ථ වීමංසකෙනාති. තයො වීමංසකා, අත්ථවීමංසකා, සඞ්ඛාරවීමංසකො, සත්ථුවීමංසකොති."*[19]

එනම්,

[17] නිද්දේස, 11 පිටුව, 283.

[18] ශ්‍රී කල්‍යාණි දුරුතු ධර්ම දේශනා, සංස්. මොරවක ධම්මානන්ද ස්ථවිර, ශ්‍රී කල්‍යාණි රජමහවිහාරය, 307 පිටුව, 2007.

[19] පපඤ්චසූදනී අටුවාව, සයිමන් හේවාවිතාරණ, සංස්කරණය, 315 පිටුව, 1948.

02 MAY 2012

01. අර්ථවීමංසක
02. සඞ්කාරවීමංසක
03. සත්ථුවීමංසක

වශයෙන් වීමංසනය ත්‍රිවිධ වන අයුරු ගෙනහැර දක්වයි.

අර්ථවීමංසක :-
යනු පද බෙදා දැක්වීමට සමත් පණ්ඩිත මිනිසුන්ය.[20]

සඞ්කාරවීමංසක :-
නම් ස්කන්ධ, ධාතු ආයතනා දී වශයෙන් හේතුප්‍රත්‍යා ධර්මයන්හි යථා ස්වභාවය අනිත්‍යා දී වශයෙන් විමසා බලන්නා යි.[21]

සත්ථුවීමංසක :-
නම් තථාගත වූ බුදුරජාණන් වහන්සේ පිළිබඳ විමර්ශනය කරන්නා යි.[22]

මේ අනුව මෙම සූත්‍රයෙහි මූලික අවධානය යොමු කරනුයේ ශාස්තෘවරයාණන් වහන්සේ පිළිබඳ විමර්ශනයට ලක්කිරීම සම්බන්ධවයි. ඒ අනුව බුද්ධශ්‍රාවකයා කෙළෙස ශාස්තෘවරයාණන් වහන්සේ විමර්ශනයට ලක්කළ යුතු ද යන්න පහත අයුරින් විස්තර විභාගකොට ගෙනහැර දක්වනු ලැබේ.

20 "තෙසු පණ්ඩිතා හාවුසො මනුස්සා විමංසකාති. එත්ථ අත්ථවිමංසකො ආගතො."
- එම -

21 "යතො බො ආනන්ද භික්ඛු ධාතුකුසලො ච හොති, ආයතන කුසලො ච හොති, පටිච්චසමුප්පාදකුසලො ච හොති, ඨානට්ඨාන කුසලො ච හොති, එත්තාවතා බො ආනන්ද පණ්ඩිතො භික්ඛු වීමංසකොති අලං වචනායාති එත්ථ සඞ්කාරවීමංසකො ආගතො."
- එම -

22 "ඉස්මිං පන සුත්තේ සත්ථුවීමංසකො අධිප්පෙතො, චෙතොපරියායන්ති චිත්ත පරිච්ඡේදං සමන්නේසනාති එසනා පරියෙසනා උපපරික්ඛා. ඉති විඤ්ඤාණායාති එවං විජානනත්ථාය"
- එම -



01. පරසිත් නොදන්නා වූ භික්ෂුව සෑම කල්හිම බුදුන්වහන්සේගේ ධර්ම දෙකක් පිළිබඳව විමර්ශනයට ලක්කළ යුතු වේ. එනම්, ඇසින් හා කණින් දතයුතු ධර්මයන් පිළිබඳව ය. ඇසින් හා කණින් දතයුතු වූ ක්ලේශ සහගත යම් ධර්ම වෙත්නම්, ඒ ධර්ම තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි විමසිය යුතුය. මෙම කාරණය විමසන භික්ෂුව මෙසේ දැනගනියි. එනම් තථාගතයන් වහන්සේට ඇසින් හා කණින් දතයුතු කෙලෙස් ධර්ම නැතැයි අවබෝධ කරගනී. මේ අනුව මෙම කාරණය පිළිබඳ දීර්ඝ වශයෙන් අධ්‍යයනය කරනු ලැබේ. මෙම පළමු කරුණ වේ.[23]

02. ඇසින් හා කණින් කෙලෙස් බවින් යුත් යම් ධර්මයක් ඇද්ද, හෙතෙම තථාගතයන් වහන්සේට නැතැයි පර්යේෂණ කොට මෙසේ දැන ගන්නේ ද, ඉන් පසුව ද ඒ පිළිබඳව අධ්‍යයනය කෙරේ. ව්‍යතිමිශ්‍ර වූ යම් ධර්ම කෙනෙක් වේ ද, ඒවා තථාගතයන් වහන්සේට ඇද්ද හෝ නැද්ද යන්න විමසා නැතැයි තීරණය කරනු ලැබේ. මෙය තථාගතයන් වහන්සේ පිළිබඳ දෙවන විමසීමයි. අනතුරුව තවදුරටත් මෙලෙස විමසයි.[24]

03. ඇසින් හා කණින් දතයුතු වූ යම් පිරිසිදු ධර්ම කෙනෙක් වෙත්නම් ඒවා තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දයි විමසා බලන්නේය. ඒ කාරණය පරීක්ෂා කරණ භික්ෂුව මෙසේ දැනගනියි. පිරිසිදු වූ යම් යම් ධර්ම වෙත්නම් ඒ ධර්ම තථාගතයන් වහන්සේට ඇතය කියා ය. මෙලෙස පරීක්ෂා කරන භික්ෂු එය තහවුරු කරගත් කල්හි

23 මජ්ඣිම නිකාය, චූළයමක වග්ගය, වීමංසක සූත්‍රය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 744 පිටුව, 2004.
"...... යෙ සංකිලට්ඨා චක්ඛසොත විඤ්ඤෙය්‍යා ධම්මා න තෙ තථාගතස්ස සංවිජ්ජන්ති"

24 - එම -, 744 පිටුව.
"...... යෙ විතිමිස්සා චක්ඛසොත විඤ්ඤෙය්‍යා ධම්මා න තෙ තථාගතස්ස සංවිජ්ජන්තිති."

02 MAY 2012

තවදුරටත් පරීක්ෂා කරනු ලැබේ. මෙය බුදුන් වහන්සේ පිළිබඳ කරන තෙවන විමසීමයි.[25]

04. තථාගත බුදුරජාණන් වහන්සේ බොහෝ කලක් කුසල ධර්මයෙන් (ආජීව අෂ්ටමක ශීලයෙන්) යුක්ත වූයේ ද, නැතිනම් සුලු කාලයක් කුසල ධර්මයෙන් යුක්ත වූයේ දැයි පරීක්ෂා කරන්නේ ය. එසේ පරීක්ෂා කරන භික්ෂූන් වහන්සේ මෙසේ අනාවරණය කර ගනියි. එනම් තථාගතයන් වහන්සේ බොහෝ කාලයක් තිස්සේ මේ කුසල ධර්මයෙන් යුක්ත වූයේයැයි දැන ගන්නා අතර, එමෙන්ම සුළු කාලයක් තුළ නොවන බව ද අනාවරණය කර ගනී. මෙය සිව්වන විමසීම වන අතර, ඉන්පසු තවදුරටත් විමසීම සිදු කරනු ලැබේ.[26]

05. තථාගත සම්මාසම්බුදු රජාණන් වහන්සේ ප්‍රසිද්ධ බවට පැමිණියේ ය, පිරිවර ආදි යසසට පැමිණියේ ය, උන්වහන්සේට මේ ලෝකයෙහි යම් යම් දෝෂ ඇත්දැයි පරීක්ෂා කරනු ලැබේ. එසේ පරීක්ෂා කරන මහණ මෙසේ පිළිතුරු ලබන්නේ ය. යම්තාක් ප්‍රසිද්ධ බවට නොපැමිණියේ ද, පිරිවර සම්පත් නොලබුවේ ද ඒතාක් දොස් නොමැති බවත්, උක්ත සම්පත් ලැබුවේ යම් අවස්ථාවක ද, එම අවස්ථාවේ ලෝකයෙන් යම් යම් දෝෂ ඇතිවෙත්, එසේ ද වුවත් භික්ෂුන් වහන්සේ සම්පත්තියෙන් උක්ත වූයේ නමුදු දෝෂයන්ගෙන්

[25] - එම -, 746 පිටුව.
"...... යෙ වොදාතා චකඛසොත විඤ්ඤෙයයා ධමමා, සංවිජ්ජන්තිවා න තෙ තථාගතස්ස නො වාති. තමෙනං සමන්නෙසමානො එවං ජනාතිඃ යෙ වොදාතා චක්ඛුසොතවිඤ්ඤෙයයා ධම්මා, සංවිජන්ති තෙ තථාගතස්සාති"

[26] - එම -,
"...... තතො නං ධම්ම, උදාහු ඉත්තරසමාපන්නොති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති. දීඝරත්තං සමාපන්නො අයමායස්මා ඉමං කුසල ධම්මං, නායමායස්මා ඉත්තරසමාපන්නොති"



විනිර්මුක්ත වූයේ යැයි දැනගනී. මෙය පස්වන කරුණ වන අතර, අනතුරුව තවදුරටත් පරීක්ෂා කරනු ලැබේ.[27]

06. තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ නිර්භය වූයේ ද, භයින් යුක්ත වූයේ නොවේ ද, රාගය නැති කිරීමෙන් පහවූ රාග ඇති බැවින් කාමයන් සේවනය නොකරන්නේ ද, යනුවෙන් පරීක්ෂා කරන්නේ ය. ඒ අනුව මෙසේ අවබෝධ කරගනී. නිර්භය වූයේ ය, පහවූ රාග ඇත හෙයින් කාමසේවනය නොකරන්නේ ය යනුවෙනි. මෙ තථාගතයන් වහ්නසේ පිළිබඳ සයවන විමසුමයි.[28]

මෙලෙසින් තවදුරටත් වීමංසක සූත්‍රය අධ්‍යයනය කිරීමේ දී ගම්‍ය වනුයේ තථාගතයන් වහන්සේ පිළිබඳ ශ්‍රාවකයන් වහන්සේලාට ඕනෑම අවස්ථාවක විමර්ශනය කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබාදෙන ලද බවයි. මෙම තත්ත්වය වීමංසක සූත්‍රයෙහි අන්තර්ගත පහත සූත්‍ර පාඨයෙන් මැනවින් අනාවරණය වේ.

> *"වීමංසකෙන භික්ඛවෙ භික්ඛුනා පරස්ස චෙතොපරියායං අජානන්තෙන ද්වීසු ධම්මෙසු තථාගතො සමන්නෙසිතබ්බො චක්ඛු සොතවිඤ්ඤෙයොසු ධම්මෙසු."*[29]

[27] - එම -,
"...... තමෙනං සමන්නේසමානො එවං ජානාති. ඤත්තප්ඣාපන්නො ආයමායස්මා භික්ඛු යස්මපත්තො, නාස්ස ඉධෙකච්චේ ආදීනවා සංවිජ්ජන්ති."

[28] - එම -, 746 පිටුව.
"...... අභයපරතො අයමායස්මා නායමායස්මා භයපූරතො, වීතරාගත්තා කාමෙ න සෙවති බයා රාලස්සාති. තමෙනං සමන්නෙසමානො එවං ජනාති අභයපරතො අයමායස්මා, නායමායස්මා, භයපූරතො, වීතරාගත්තා කාමෙ න සෙවති බයා රාගස්සාතී."

[29] මජ්ඣිම නිකාය, චූළයමක වග්ගය, වීමංසක සූත්‍රය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 744 පිටුව, 2004.

එමනිසා විමංසනය පිළිබඳ පවත්නා ස්වාධීනත්වය අනෙකුත් සමයාන්තර ආගමික දර්ශනවාදයන්ගෙන් බුදුසමය වෙන්කොට දක්වන ප්‍රබල සාධකයක් ලෙස ගෙනහැර දැක්විය හැකිය. බුද්ධ සීහනාද සූත්‍රය වශයෙන් හඳුන්වන වීමංසක සූත්‍රය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දකි. බුදුන් වහන්සේ පිළිබඳ කරණ ස්වයං අධ්‍යයනකි. මෙහිදී විමසීමට ලක්කළ යුත්තේ අමූලික ශ්‍රද්ධාවෙන් නොව ආකරවතී ශ්‍රද්ධාවෙන් යුක්තවය. වීමංසක සූත්‍රයෙහි මෙලෙස ගෙනහැර දක්වයි.

*"යස්ස කස්සචි භික්ඛවෙ ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි බ්‍යඤ්ජනෙහි තථාතතො සද්ධා නිවිට්ඨා හොති. මූලජාතා පතිට්ඨිතා, අයං වුච්චති භික්ඛවෙ ආකාරවතී සද්ධා දස්සනමූලිකා දළ්හා, අසංහාරියා සමණෙනවා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං."*[30]

"අමූලිකා ශ්‍රද්ධාව" යනු අවිචාරවත් වූ මුලාවූ ශ්‍රද්ධාව යි. "ආකාරවතී ශ්‍රද්ධාව" යනු විචාර බුද්ධියෙන් කරුණු අවබෝධ කරගෙන ඇතිකරගන්නා වූ පැහැදීමයි. උක්ත අදහස් අටුවාව මෙලෙස ගෙනහැර දක්වනු ලැබේ.

> *"ඉමෙහි ආකාරෙහීති ඉමෙහි සත්ථුවීමංසනකාරණෙහි....*
> *සොතාපත්තිමග්ගො හි සද්ධාය මූලං නාම, ආකාරවතීති*
> *කාරණං පරියෙසිත්වාගහිතත්තා සකාරණා"*[31]

මේ අනුව දෘෂ්ටි ප්‍රහාණයෙන් යුත් විවෘත මනසකින් හෙබි අන්ධ භක්තියෙන් තොර ප්‍රඥාවන්ත විචාරශීලී පුද්ගලයාට යථාභූතඥානදස්සනය පහළ වන බව මෙයින් තහවුරු වේ. තථාගතයන් වහන්සේ පිළිබඳ වීමංසනය ද එලෙසම ය.

---

[30] - එම -, 750 පිටුව.

[31] පපඤ්චසූදනී අටුවාව, සයිමන් හේවාවිතාරණ සංස්කරණය, 323 පිටුව, 1948.



## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය :-


- අඞ්ගුත්තර නිකාය, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005.
- ආගම දර්ශනය හා සදාචාරය, එම්.ඒ. මනුරත්න, මනුලා මුද්‍රණාලය, 1995.
- ආදී බෞද්ධ චින්තනය අදහස් කිහිපයක්, චන්ද්‍රිම විජය බණ්ඩාර, එච්.එම්. මොරටුවගම, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1995.
- ඉස්ලාම් ධර්මය හා සමාජ ක්‍රමය, වී.ජී. නන්දන පෙරේරා, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2004.
- ජීවමාන බයිබලය, නව ගිවිසුම, තිසර මුද්‍රණ, දෙහිවල, 1980.
- දීඝනිකාය, ද්විතීය භාගය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005.
- ධම්මපදය, ලෙවන්ගම සරණංකර සංස්. 1983.
- නිද්දේස, ii
- පපඤ්චසූදනී අටුවාව, සයිමන් හේවාවිතාරණ, සංස්කරණය, 1948.
- මජ්ඣිම නිකාය, දෙවන කාණ්ඩය, ඒ.ජී. ද සොයිසා, සිංහල පරිවර්තනය, ධර්මසමය යන්ත්‍රාලය, කොළඹ, 1962.
- සමන්තකූටවණ්ණනා,
- සංස්කෘත සාහිත්‍යය, ජී.එස්.බී. සේනානායක, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, ද්වතීය සංස්කරණය, 1960.

- <u>සිංහල විශ්වකෝෂය</u>, සිව්වැනි කාණ්ඩය, (ඉන්දු - උෆරා), සංස්කෘතික දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය, 1970.
- <u>ශ්‍රී කල්‍යාණි දුරුතු ධර්ම දේශනා,</u> සංස්. මොරවක ධම්මානන්ද ස්ථවිර, ශ්‍රී කල්‍යාණි රජමහවිහාරය, 2007.